සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

**11 ශ්‍රේණිය** **කතෝලික ධර්මය I** **කාලය පැය 1 යි**

නම/ විභාග අංකයඃ

- සියලුම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. ගැලවීමේ ඉතිහාසය තුළ අඩංගු විවිධ සිද්ධීන් හා අත්දැකීම්වල පරමාර්ථය වන්නේ,
    (1) පුද්ගල චරිත පිළිබඳ වාර්තා කිරීමය. (2) දේව විශ්වාසය වර්ධනය කිරීමය.
    (3) ඉතිහාසය පිළිබඳ දැනුවත් කිරීමය. (4) ජනතාව මුහුණ දුන් ගැටළු වාර්තා කිරීමය.

02. දේව ආශිර්වාදය හිමිකර ගැනීමට අප ජීවත් විය යුත්තේ,
    (1) දස පනතට අනුවය. (2) වැඩිහිටි අවවාද අනුවය.
    (3) පරිත්‍යාගශීලීවය. (4) නිහතමානීවය.

03. අපෝස්තුලුවරුන්ගේ සිට පැවත එන ඉගැන්වීම් අන්තර්ගත වන්නේ,
    (1) ශුද්ධ ලියවිල්ල තුළය. (2) විශ්ව ලේඛන තුළය.
    (3) ජීවන සහා සම්ප්‍රදාය තුළය. (4) සුබාරංචි තුළය.

04. පහත දැක්වෙන වගන්ති සලකා බලන්න.
    A ජුදයේ හා සමාරියේ සාක්ෂි දැරීම. B ධර්මදූත සේවයට සූදානම
    C ශුද්ධවූ පාවුලු තුමාගේ ධර්මදූත සේවය. D ජෙරුසලමෙහි සාක්ෂි දැරීම.
    ඉහත ප්‍රකාශ නිවැරදි පිළිවෙලට සඳහන් වන වරණය වන්නේ,
    (1) A, B, C, D (2) A, D, C, B (3) B, D, A, C (4) D, C, B, A

05. ශුද්ධවූ පාවුලුතුමා, රෝම පුරවැසිභාවය පදනම් කර ගනිමින් රෝම අධිරාජ්‍යයාගේ විනිශ්චය ඉල්ලීමේ අරමුණ වූයේ,
    (1) නිදහස ලබා ගැනීමයි. (2) සුබාරංචිය දේශනා කිරීමයි.
    (3) හිතවතුන් හමුවීමයි. (4) අවමානයට ලක් නොවීමයි.

06. ''ජෝනාගේ පුත් සීමොන් ඔබ ඉතා භාග්‍යවන්තය.'' (ශු. මතෙව් 16:17-19) ට අනුව ඉහත සඳහන් ප්‍රකාශය අදාළ වන්නේ,
    (1) පේදුරුතුමාගේ මහා ප්‍රකාශනයට ය.
    (2) ජේසුස් වහන්සේ හා අනුගාමී වීමට ආරාධනා කළ අවස්ථාවට ය.
    (3) දැල් හෙළන්නට වදාළ අවස්ථාවට ය.
    (4) තම පව්කාර බව පිළිගත් අවස්ථාවට ය.

07. කෝට්ටේ රාජධානිය පාලනය කළ රජතුමාගේ ඉල්ලීම පරිදි ක්‍රි.ව. 1543 ලංකාවට පැමිණි පළමු ධර්මදූත කණ්ඩායම අයත් වන්නේ,
    (1) ජේසු නිකායටය. (2) දොමිනිකාන නිකායටය.
    (3) අගුස්තීනු නිකායටය. (4) ප්‍රැන්සිස්කාන නිකායටය.

08. A නාදුනන සෙනඟක් අතරට ස්වේච්ඡාවෙන් පැමිණෙන ලදී.

B කිතුනුවන් සොයා යමින් අඛණ්ඩ සේවයක නිරත විය.

C දේශීය කිතුනු සාහිත්‍යයේ පුරෝගාමියා විය.

D වසූරිය වැළඳුන රෝගීන්ට උපස්ථාන කරන ලදී.

ඉහත ප්‍රකාශ පිළිවෙලින් පෙළ ගැස් වූ විට වඩාත් නිවැරදි වරණය වන්නේ,

(1) A, B, C (2) A, D, C (3) A, B, D (4) B, C, D

09. ශුද්ධ සභාවේ.............. සඳහා අවංකව වෙහෙසීම හා වැයවීම අපගේ යුතුකම වේ. හිස්තැනට සුදුසු වරණය තෝරන්න.

(1) අභිවෘද්ධිය (2) එකමුතුකම (3) සංවර්ධනය (4) සාමූහිකත්වය

10. ආසිරි කුසලාන ගෙන ආශිර්වාද කරන විට ඉන් අදහස් වන්නේ,

(1) මෙල්කිසෙදෙක්ගේ යාගය පිළිබඳවය.

(2) ක්‍රිස්තුන් වහන්සේගේ රුධිරයේ සහභාගීකම පිළිබඳවය.

(3) ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරයේ හා සහභාගිකම පිළිබඳවය.

(4) පාස්කු මංගල්‍යය පිළිබඳවය.

11. දිව්‍ය සත්ප්‍රසාදය යනු අඛන්ඩව පැවැත්විය යුතු වත්පිළිවෙතක් පමණක්ම නොවන්නේ එය,

(1) ප්‍රේමයේ හා විශ්වාසයේ දේව ප්‍රසාද නිධානයක් වන බැවිනි.

(2) ප්‍රේමයේ හා එකමුතුකමේ දේව ප්‍රසාද නිධානයක් වන බැවිනි.

(3) ආදරයේ හා කරුණාවේ දේව ප්‍රසාද නිධානයක් වන බැවිනි.

(4) ආදරයේ හා විශ්වාසයේ දේව ප්‍රසාද නිධානයක් වන බැවිනි.

12. සියලු යාග සම්පූර්ණත්වයට පත් වන්නේ,

(1) සත්ව යාගයෙනි. (2) කල්වාරි යාගයෙනි.

(3) නොදවන යාගයෙනි. (4) දුම් පූජා යාගයෙනි.

13. විශ්වාසය පෝෂණය කරගෙන වර්ධනය කර ගැනීමට අපට ආරාධනා කරන්නේ,

(1) පළමු දේව පනතය. (2) දෙවන දේව පනතය.

(3) පස්වන දේව පනතය. (4) නවවන දේව පනතය.

14. "ඔබ දෙවි සමිදාණන් වහන්සේට පමණක් ගරුබිය පෑ යුතුය. ඔවුන් වහන්සේට පමණක් වැඳුම් පිදුම් කළ යුතුය." මෙලෙස සඳහන් වන්නේ,

(1) හිතෝපදේශයේ ය. (2) ගීතාවලියේ ය.

(3) මහෝපදේශයේ ය. (4) ද්විතීය නීති සංග්‍රහයේ ය.

15. තම සහෝදරයාට 'ජඩයා' කියා ගරහන කවරෙකුට වුවද ලැබෙන දඬුවම වන්නේ,

(1) අධිකරණයට යටත් වීමය. (2) ශ්‍රේෂ්ඨාධිකරණයට යටත් වීමය.

(3) නිරාගින්නට ගොදුරු වීමය. (4) ස්වර්ග රාජ්‍යය අහිමි වීමය.

16. අනුන් සතු වස්තුව සෘජුව හෝ වංචනිකව හෝ තමා සතුකර ගත් අය විසින් කළ යුත්තේ,

(1) අයිතිකරුවා ජීවත්ව සිටීදැයි සොයා බැලීමය.

(2) වස්තුව පිළිබඳව පවුලේ අය දැනුවත් කිරීමය.

(3) ඒවා අයිතිකරුවන්ට නැවත බාරදීමය.

(4) නීතියේ පිළිසරණ පැතීමය.

17. අවශ්‍යතාවයෙන් පෙළෙන්නන්ට උදව් උපකාර කිරීම ප්‍රේමයේ එක් අරමුණක් බව ප්‍රකාශ කරන්නේ,

(1) ශුද්ධවූ අම්බ්‍රෝසි තුමාය. (2) ශුද්ධවූ අගුස්තීනු තුමාය.

(3) ශුද්ධවූ මැක්ෂිමිලියම් කෝල්බේ තුමාය. (4) ශුද්ධවූ ජෝන් ක්‍රිසොස්තොම් තුමාය.

18. 'මා උපන්නෙත් ලොව පහළ වූයේත් සත්‍යයට සාක්ෂි දරන පිණිසය.' මෙම උපුටනය අදාළ වන්නේ,
(1) ශුද්ධවූ මැක්ෂිමිලියම් කොල්බේ තුමාට ය. (2) ශුද්ධවූ දෙවන ජුවාම් පාවුළු පාප්වහන්සේට ය.
(3) ස්නාවක ජොහාන් තුමාට ය. (4) ක්‍රිස්තුන් වහන්සේට ය.

19. අපෝස්තුලුවරුන්ගෙන් පැවත එන එකම ශුද්ධ වූ කතෝලික සභාව ඉදිරියට ගෙන යාම සඳහා කටයුතු කළ යුත්තේ,
(1) අපෝස්තුලුවරුය. (2) පාප් වහන්සේය.
(3) ක්‍රිස්තු අනුගාමිකයන්ය. (4) රදගුරුතුමාය.

20. සෑම වසරකම ජනවාරි මාසයේ සිට සභා සමගිය උදෙසා යැදුම් සතියක් පැවැත්වීම,
(1) කිතුනු සභා සංවාදයේ ප්‍රතිඵලයකි. (2) දේශානුරූපීකරණයේ ප්‍රතිඵලයකි.
(3) රදගුරු මණ්ඩලයේ තීරණයකි. (4) ශාසන ආරක්ෂක මණ්ඩලයේ තීරණයකි.

21. ජුදෙව්වරුන් හා ප්‍රෙතෙස්තන්තවරු භාවිත කරන හේබ්‍රෙව් පිටපත බිහිවූයේ,
(1) සෙප්ටුවාජින්තයෙනි. (2) ග්‍රීක පිටපතෙනි.
(3) ජුදා මූලාශ්‍රයෙනි. (4) අසිරියානු මූලාශ්‍රයෙනි.

22. කණ්ඩායම් වශයෙන් මෙහෙවරෙහි යෙදීම,
(1) ලේබක දිවැසිවරුන්ගේ ලක්ෂණයකි. (2) දේශක දිවැසිවරුන්ගේ ලක්ෂණයකි.
(3) සුළු දිවැසිවරුන්ගේ ලක්ෂණයකි. (4) ප්‍රධාන දිවැසිවරුන්ගේ ලක්ෂණයකි.

23. කිතුනු අපගේ එකම මාර්ගය කුරුසියේ මඟ බව පසක් කර දෙනු ලබන්නේ,
(1) ශුද්ධවූ මාක් තුමාය. (2) ශුද්ධවූ ජුවාම් තුමාය.
(3) ශුද්ධවූ ලූක් තුමාය. (4) ශුද්ධවූ මතෙව් තුමාය.

24. ශුද්ධ බයිබලයේ පැරණි ගිවිසුමේ සඳහන් කථාවලින් පෙන්වා දෙන්නේ,
(1) දෙවියන් වහන්සේ ලෝකය මැවූ ආකාරය ය.
(2) දෙවියන් වහන්සේ ලෝකයේ මැවුම්කරුවාණන් බවය.
(3) දෙවියන් වහන්සේ මිනිසා මැවූ ආකාරය ය.
(4) දෙවියන් වහන්සේ මිනිසාට බුද්ධිය දී ඇති බවය.

25. "නුඹ ගෙයක් දොරක් නැති මිහිපිට ඉබාගාතේ යන මිනිසෙක් වන්නෙහිය." දෙවියන් වහන්සේ මෙම දඬුවම දෙනු ලබන්නේ,
(1) ඒවට ය. (2) ආදම්ට ය. (3) සර්පයාට ය. (4) කායින්ට ය.

26. උත්පත්ති 6/5-7, 6/17 හි සඳහන් වන පරිදි ආදි මව්පියන්ගේ සිට මෙලොව වර්ධනය වූ පාපය උච්චස්ථානය කරා පැමිණෙන්නේ,
(1) නෝවාගේ කාලයේය. (2) කායින්ගේ කාලයේය.
(3) ආබ්‍රහම්ගේ කාලයේය. (4) මෝසෙස්ගේ කාලයේය.

27. තම දූත මෙහෙවර ආරම්භ කරන ස්නාවක ජොහාන් තුමා අභියෝගාත්මක ආකාරයෙන් පොළොං වංශය යනුවෙන් හඳුන්වන්නේ ඊශ්‍රායෙලයේ,
(1) සාමාන්‍යය ජනතාවය (2) හේවායන්වය.
(3) අයකැමියන්වය. (4) ප්‍රභූ ජනතාවය.

28. 'දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඇසට පෙනෙන අයුරින් නොපැමිණෙයි' ක්‍රිස්තුන් වහන්සේ මෙයින් අවධාරණය කරන්නේ,
(1) දේව රාජ්‍යය සොයා යා යුතු බවය. (2) දේව රාජ්‍යය අප අතර බවය.
(3) දේව රාජ්‍යය දර්ශනය වන බවය. (4) දේව රාජ්‍යය දැකිය නොහැකි බවය.

29. යුක්තිය උදෙසා පීඩා විඳින්නෝ භාග්‍යවන්තයෝය. ........................... හිස්තැනට සුදුසු වඩාත් සුදුසු වන්නේ,
(1) ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේය. (2) ඔවුහු තෘප්තිමත් වන්නෝය.
(3) ඔවුහු සැනසීම ලබන්නෝය. (4) ඔවුහු දෙවියන් වහන්සේ දකින්නෝය.

30. ඔබ අතීන්ද්‍රිය ක්‍රිස්තු දේහයේ අවයවයක් බවට පත් වන්නේ,

(1) පාප උච්චාරණයෙනි. (2) සමගි සන්ධානයෙනි.

(3) ප්‍රසාද ස්නාපනයෙනි. (4) පූජකවරයෙනි.

31. ක්‍රිස්මා තෛලයෙන් ආලේප කිරීමෙන් සංකේතවත් වන්නේ,

(1) ආදරය දැක්වීමයි. (2) ශක්තිමත් කිරීමයි.

(3) පිරිසිදු කිරීමයි. (4) ශුද්ධවන්ත කිරීමයි.

32. දිළිඳුන්ට සුබ ආරංචිය දේශනා කිරීම සඳහා ක්‍රිස්තුන් වහන්සේව ආලේප කළ බව උන්වහන්සේ ප්‍රකාශ කරන්නේ,

(1) ප්‍රසිද්ධ ජීවිතයේ ආරම්භයේදී ය. (2) කුරුස පත්වූ අවස්ථාවේදී ය.

(3) ස්වර්ගාරෝහණයේදී ය. (4) ශ්‍රාවකයන් තෝරා ගැනීමේදී ය.

33. 'වත ඉරාගෙන නොව සිත ඉරාගෙන දෙවි සමිඳුන් වෙත හැරී එන්නට අපහට ඇරයුම් කරන දිවැසිවරයා,

(1) ජෝවෙල්ය. (2) ආමෝස්ය. (3) යෙසායාය. (4) මීකාය.

34. 'ඔබ දූවිලි බවද, දූවිල්ලට හැරෙන බවද සිහිකරන්න.' යන අදහස අවධාරණය කරන්නේ ජන වන්දනා වසරේ කවර දිනකදීද?

(1) මහ බ්‍රහස්පතින්දා ය. (2) මහ සිකුරාදා ය.

(3) ආලේලූයියා සෙනසුරාදා ය. (4) අළු බදාදා ය.

35. 'දෙවියන් වහන්සේ එක්කළ අය මනුෂ්‍යයා වෙන් නොකෙරේවා' යන ශුද්ධ ලියවිලි පාඨයෙන් පැහැදිලි වන්නේ,

(1) යාව ජීව සහකාරකමකි. (2) ආදර්ශමත් ජීවිතයකි.

(3) ප්‍රේමයෙන් ජීවත් වීමය. (4) දෙවියන් වහන්සේට ප්‍රසන්න වීමය.

36. A මෙලොව කිසිම දේපලකට උරුමකම් නොකීම.

B කීකරුකමේ ජීවිතයකට පිවිසීම.

C පැවිදි නිකායේ ශ්‍රේෂ්ඨයන්ට කීකරු වීම.

D රදගුරුතුමාගේ නායකත්වය යටතේ ගිහියාට සේවය කිරීම.

E විවාහ නොවී තම මුළු ජීවිතයම දේව රාජ්‍යය උදෙසා කැප කිරීම.

ඉහත ප්‍රකාශ අතරින් පැවිදි දිවිය හා වඩාත් නිවැරදි ප්‍රකාශන ඇතුලත් වරණය වන්නේ,

(1) A, C, D (2) B, C, D (3) C, D, E (4) A, D, C

37. සාන්ත වින්සන්ද පාවුලා සමිතිය ක්‍රි.ව. 1833 දී ආරම්භ කරන ලද්දේ,

(1) ෆැන්ක් ඩග් මහතා විසිනි. (2) අති උතුම් ලියෝ ජෝශප් හිමිපාණන් විසිනි.

(3) භාග්‍යවන්ත පෙඩ්රික් ඔසනාම් තුමා විසිනි. (4) ශුද්ධ වූ මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමා විසිනි.

38. ඇතුළාන්ත සාමයට මූලික වන කරුණු වන්නේ,

(1) යුක්තිය, සාමය හා සාධාරණත්වයයි. (2) යුක්තිය, ප්‍රේමය හා සාධාරණත්වයයි.

(3) ප්‍රේමය, නිදහස හා සාධාරණත්වයයි. (4) යුක්තිය, ප්‍රේමය හා නිදහසයි.

39. ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන ආගමනයේදී අප විනිශ්චයට ලක්කරන මිනුම් දණ්ඩ වන්නේ,

(1) යුක්තිය යි. (2) ප්‍රේමයයි. (3) පුණ්‍යක්‍රියායි. (4) මර්ධන ක්‍රියායි.

40. ක්‍රිස්තියානි ඇදහිල්ල හා විශ්වාසය තුළ හැසිරෙන කිතුනුවා කෙරෙහි බලපාන ණය යුතුකමක් ලෙස දැක්විය හැක්කේ,

(1) නිරාහාරශීලය ඇතුළු ගොඩමස් අනුභවයෙන් වැලකීමයි.

(2) පාපොච්චාරණය හා නිරාහාරශීලය රැකීමයි.

(3) නිරාහාරශීලය හා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමයි.

(4) පාපොච්චාරණය හා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමයි.

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2018
## කතෝලික ධර්මය II

11 ශ්‍රේණිය | කාලය පැය 2 යි

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

(01) කෙටි පිළිතුරු සපයන්න.

1. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දේව ප්‍රසාද නිධායනයක් ලෙස හැඳින්වීමට මුල්වන හේතු දෙකක් සඳහන් කරන්න.
2. පූප වැඩි කිරීමේ ප්‍රාතිහාර්යයේ දක්නට ලැබෙන දිව්‍ය පූජා පිළිවෙතෙහි දක්නට ඇති මූලික ලක්ෂණ දෙකක් ලියන්න.
3. පාස්කු මංගල්‍යය පැවැත්වීම පිළිබඳව දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් ජනතාවට දුන් නියෝග දෙකක් සඳහන් කරන්න.
4. බරපතල පාපයක් වන ජීවිතය විනාශ කිරීම පිළිබඳව ශුද්ධවූ ලියවිල්ල සාක්ෂි දරන ග්‍රන්ථ දෙක නම් කරන්න.
5. සුරදූත ගීත ගායනා නොකරන කාල දෙක නම් කරන්න.
6. යාවේ සම්ප්‍රදායට අයත් කථා පුවත් දෙකක් නම් කරන්න.
7. පූජක සම්ප්‍රදායට අනුව දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමඟ ඇතිකරගත් ගිවිසුමේ සඳහන් වන කරුණු දෙකක් ලියන්න.
8. ස්නාවක ජොහාන් තුමාගේ උපතින් දින අටකට පසු සිදුකළ චාරිත්‍ර දෙකක් සඳහන් කරන්න.
9. ලූක් 4/18-19 ට අනුව, ක්‍රිස්තුන් වහන්සේගේ දූත කාර්යයේ සුබසෙත උදාකර දුන් කණ්ඩායම් දෙකක් නම් කරන්න.
10. වපුරන්නාගේ උපමාවේ සඳහන් වන බීජ වැටුණු බිම් වර්ග දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 2 x 10 = 20)

02. 1. කතෝලික සභා ධර්මෝපදේශයට අනුව ගබ්සාව හඳුන්වන ආකාර දෙකක් සඳහන් කරන්න.

2. දෙවියන් වහන්සේ මැවූ ස්ත්‍රීයට හා පුරුෂයාට ආසිරි පතමින් වදාළ කරුණු තුනක් ලියන්න.

3. මිනිස් දිවිය දෙවියන් වහන්සේට පමණක් අයිති බැවින් තමාගේ මෙන්ම අන්‍යයන්ගේද ජීවිත සුරැකිය යුතු බව කරුණු පහක් යටතේ පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

03. 1. ජනවන්දනාව තුළ 'රතු' වරණය භාවිතා කිරීමේ අර්ථ දෙකක් ලියන්න.

2. සාමාන්‍ය සමය තුළ සමරණ වැදගත් මංගල්‍යයන් තුනක් නම් කරන්න.

3. බාහිර අලංකාරය හා පුහු ආටෝපවලට මූලිකත්වය දෙන ඔබ, දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය වඩා අර්ථවත් කර ගන්නේ කෙසේදැයි කරුණු 5 ක් ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

04. 1. ජොහාන් සුබාරංචියට අනුව ක්‍රිස්තුන් වහන්සේ විසින් අනාගත සභාවේ එකමුතුව වෙනුවෙන් දෙවියන් වහන්සේ ඉදිරියේ යාච්ඤා කිරීමට හේතු වූ කරුණු දෙක ලියන්න.

2. යාච්ඤාවෙන් ශක්තිය නොලැබූ අපෝස්තුලුවරුන් පරීක්ෂාවට වැටුණු බවට නිදසුන් තුනක් ලියන්න.

3. 'කිතුණු ජීවිතය යාච්ඤාව මත රඳා පවතී.' යන කියමන උදාහරණ පහක් ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

05. 1. පුරුෂයාගේ ඉලඇටයකින් ස්ත්‍රීය මැවීමෙන් අදහස්වන කරුණු දෙකක් ලියන්න.

2. විවාහයේ බාහිර සලකුණු වන විවාහ පොරොන්දුව තුළ අඩංගු ලක්ෂණ තුනක් ලියන්න.

3. විවාහය දෙවි සමිඳාණන් ඉදිරියේ සිදුවන උත්තරීතර එක්වීමක් වන බැවින් එම උත්තරීතර බව රැක ගැනීමට ඔබ කරන යෝජනා පහක් ලියන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

06. 1. ගිහි ධර්මදූත සේවා දෙකක් ලියන්න.

2. පොදු පූජකවරය ලැබූ විශ්වාසකයින්ට පැවරෙන ත්‍රිවිධ කාර්යයන් නම් කරන්න.

3. වර්තමාන සමාජයේ පවතින ගැටළුකාරී තත්වයන් හමුවේ සභාවක් වශයෙන් ගිහි පැවිදි අපගේ කාර්යභාරය කරුණු පහකින් ලියා දක්වන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

07. පහත සඳහන් මාතෘකා දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

1. ලන්චියානු නුවර ප්‍රාතිහාර්යය.

2. අති උතුම් ප්‍රැන්සිස් පාප් වහන්සේ

3. මරිය හමුදාව

4. පුණ්‍ය ක්‍රියා

(ලකුණු 5 x 2 = 10)

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 2 ) | 02. ( 1 ) | 03. ( 3 ) | 04. ( 3 ) | 05. ( 2 ) | 06. ( 2 ) | 07. ( 4 ) | 08. ( 3 ) | 09. ( 1 ) | 10. ( 2 ) |
| 11. ( 2 ) | 12. ( 2 ) | 13. ( 1 ) | 14. ( 4 ) | 15. ( 3 ) | 16. ( 3 ) | 17. ( 4 ) | 18. ( 4 ) | 19. ( 3 ) | 20. ( 1 ) |
| 21. ( 3 ) | 22. ( 2 ) | 23. ( 2 ) | 24. ( 2 ) | 25. ( 4 ) | 26. ( 1 ) | 27. ( 4 ) | 28. ( 2 ) | 29. ( 1 ) | 30. ( 3 ) |
| 31. ( 3 ) | 32. ( 1 ) | 33. ( ) | 34. ( ) | 35. ( 1 ) | 36. ( 1 ) | 37. ( 3 ) | 38. ( 4 ) | 39. ( 3 ) | 40. ( 1 ) |

(ල. 40)

## II පත්‍රය

01. 1. ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කර තිබීම. / ජීවමාන ක්‍රිස්තුන් වහන්සේ වැඩ සිටීම.
 2. රොටී ගැනීම / තුති පිදීම / රොටි කැඩීම / බෙදාදීම.
 3. පාස්කුව ඉශ්‍රායෙල් ජනතාවට අනුස්මරණ දිනයක් ලෙසද සමිඳාණන් වහන්සේට මංගලෝත්සව දිනයක් ලෙසද පැවැත්වීම / මතු සියලු පරම්පරා සදහටම එය මංගල දිනයක් ලෙස පැවැත්වීම.
 4. ජෙරමියා / ගීතාවලිය
 5. චතාරික හා ආගමන
 6. මැවීම පිළිබඳ දෙවන කථාව / ආදම් හා ඒව පාපයට වැටීම / කායින් හා ආබෙල් සිද්ධිය.
 7. දරුසම්පත් දෙමින් ජාතීන් උපදවන බව, රජවරු පහළවන බව / කානාන් දේශය ආබ්‍රහම්ට හා ඔහුගේ පෙළපතට සදහටම අයිතිකොට දෙන බව.
 8. චර්මඡේදන පිළිවෙත හා නම් තැබීම.
 9. දිළිඳුන්, වහලුන්, පීඩිතවූවන්, අන්ධ අය.
 10. මඟදිගේ / පස් නැති ගල් බිමේ / කටු අතර / සරු බිම.

02 1. ඝාතනයකි / අශික්ෂිත අපරාධයකි.
 2. දරු සම්පත් ලබා වැඩි වර්ධනය වීම / පොළව පුරා පැතිර එය යටත් කර ගැනීම. / මුහුදේ මසුන්, අහසේ පක්ෂීන් හා පොළොවේ සැරිසරන සියලු සතුන් කෙරෙහි බලය පැවැත්වීම.
 3. සිසුවා ලියා ඇති කරුණු සලකා බලා ලකුණු ලබා දෙන්න.

03 1. ප්‍රාණ පරිත්‍යාගීබව හෝ ඇදහිල්ලට සාක්ෂි දැරීම / ගින්නෙහි රුධිරයෙහි අරුත
 2. ශුද්ධවූ ත්‍රිත්වයේ මංගල්‍යය / දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යය / දිව්‍ය හෘදයේ මංගල්‍යය (10 පෙළපොත 11 පිටුව)
 3. ලෞකිකත්වයට මුල් තැන නොදී අධ්‍යාත්මිකත්වය මුල් කරගනිමින් සැබෑ සූදානමකින් යුතුව අර්ථවත්ව කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව කරුණු දක්වමින් ලියා ඇති කරුණු සලකා බලා ලකුණු පිරිනමන්න.

04 1. ඔබ මා තුළද මා ඔබ තුළද සිටින්නාක් මෙන් ඔවුන්ද අප තුළ ඒකත්වයක් වන පිණිස / ඔබ මා එවා වදාළ බව ලෝකයා විශ්වාස කරන පිණිස. (පිටුව 122)
 2. ක්‍රිස්තුන් වහන්සේව අතහැර පලා යෑම. / උත්තම පූජකවරයාගේ දාසයා වූ මල්කුස්ගේ කණ කපා හෙළීම / පේදුරුතුමා තෙවරක් ඔවුන් වහන්සේව නාඳුනන බව ප්‍රකාශ කිරීම. (පිටුව 127)
 3. සියලු කාරණාවලදී දෙවිඳුන් මත යැපීම සම්බන්ධ කරමින් දක්වා ඇති කරුණු සලකා ලකුණු පිරිනමන්න.

05 1. ඔහුට සහායවන්නියකි / ප්‍රේමය මත පදනම් වේ / සම මානව ගරුත්වය / එකිනෙකා සම්පූර්ණ විට (11 පෙළපොත 19 පිටුව)
 2. විශ්වාසවන්ත වීම / ප්‍රේම කිරීම / ගෞරව කිරීම (විවාහ පොරොන්දුව ලියා ඇත්නම් ලකුණු පිරිනමන්න. (පිටු 11/79)
 3. පිරිසිදු චරිත පැවැත්ම / අන්‍යෝන්‍ය ප්‍රේමය / අවබෝධය / තේරුම් ගැනීම / පරිත්‍යාගය / විශ්වාසවන්තබව ආදි කරුණු ඇතුලත්ව තිබිය යුතුය.

06 1. කිතුදන පුබුදුව / මරිය හමුදාව / දිව්‍ය හෘදයේ සමිතිය (11 පෙළපොත 86 පිටුව)
 2. එඬේරික කාර්යය / පූජක කාර්යය / දිවැසිවර කාර්යය
 3. වර්තමාන සමාජයේ පවතින කාලීන ගැටළු පිළිබඳ ගිහි පැවිදි අපගේ දායකත්වය ලබා දෙමින් අවශ්‍ය මඟ පෙන්වීම් (සභාවක් වශයෙන්) ලබා දීමට කටයුතු කිරීම සිදු විය යුතු බවට කරුණු ඉදිරිපත් කර තිබිය යුතුයි.

07 1. 10 පෙළපොත 47 පිටුව
 2. 10 පෙළපොත 32 පිටුව
 3. 11 පෙළපොත 85 පිටුව
 4. 11 පෙළපොත 100, 101, 102 පිටු